

# පව!

**රසික සූරියආරච්චි**

පෙර දිනක, දුරු රටක
සිහිනයෙන් ගෑ සුවඳ
තවම මතක ද ඔබට?

මල් පෙති සුමුදු බව
මීදුමක ඝනකම
සිත පෙළූ කණිසම
කිලිටි ඇතිරිල්ලක
පැතිර ගිය රතු පැල්ලම
කිලිටි සිත් දෙකකට
නොවිණි පැනයක් කිසි ලෙස

දශක දෙකකට ඉස්සර
මැරුණු කළලය සිහිකර
මතක වස්ත්‍රය පුදනට
ලැබුණු කාලය මද විය

දසත ගනදුර දුරුකර
හිරු නැගුණු ඒ අලුයම
කිලිටි සිත නිරුවත් බව
අතුරු සැණෙකින් වැටහිණ!

# කැස්වටුවන්ගේ කථාව

**අතුල විජේවික්‍රම**

පුරුදු ගම් බිම්
අතැර

යෝධ පෙන්ගුයින්
කුරුල්ලන් මැද
බියෙන් සැඟවී
අහුල ලා කන

පාට තුනපහ
පුංචි පැටවුන්
ලෝකයට මුදවා හරින්නට
නේක වැඩ කර යෝධයින් හට

රිදෙන තටු පිරිමදින අතරේ
හීන දකිමින් නිදි වැළඳ ගත්
කැස්වටුවකුගේ කථාවක් ගැන
කිව්ව මතකයි තාත්තා මට
නින්ද එනතුරු ඒ දවස් වල

තුරුළු කරගෙන
පිරිමදින හිස ...



# නුඹ අහක බැලූවාම

**මංගලිකා ප්‍රනාන්දු**

**හැමදාම යන ගානෙ නුඹෙ සිතට එබුණාම**
**තරු පිපෙන නෙතඃ අගින් හිනැහෙනව හැමදාම**
**දිලි දිලී සඳු නැගෙයි හිත් අහස පුරහාම**
**හැමදාම දැකගන්න මම එනව ඉඳුරාම**

**නිසංසල පෙම් විලේ මල් හීන පිපුණාම**
**සුව_ කැන් විසිරේවි හාත්පස දවටාන**
**කුළු විසි කර ඈත මට එන්න හිතඃණාම**
**ඔය සිහින රජ දහනෙ මට ඉඩක් දෙනවාද**

**හොර රහසෙ නුඹෙ හිතට රිංගන්න හැදුවාම**
**හිතේ දොරගුලු ලාන නුඹ යාවි නොබලාම**
**මල්වරණ අතඃ අගට මලක් වී හැමදාම**
**මද සිනා කැලුම් දී නුඹ යාවි පෙරසේම**

**සුදුපාට පිනිබින්දු මල් මතට වැටුණාම**
**කැළඹේවි සිත් මලම මකරන්නද සඟවාම**
**සිප සිහින පෙරසේම දුර ඈත ඇදුනාම**
**සිත තනිව ලතවේවි නුඹ අහක බැලූවාම**

# නියඟලාවට කියන වගනම්

**නාලිනී ද සිල්වා**

පින්න පිරුනු ලන්ද කොනේ මල් යහනේ පිබිදෙන්නේ
ගින්න දලුව රස පහසට නොවෙදැයි හැඩ වැඩ වෙන්නේ
කන්නයකට කන්න බතල ගෙඩි වාගේ අල දෙනේනේ
යන්න හිතාගෙන මිස හෙම නැහැ සුදු බතලම කන්නේ

අවුසදේට අනගි වුනත් ජීවිතේට දුක දෙන්නේ
පුංචි ලමයි ඉන්නා තැන ඉඩක් එහෙම නැහැ දෙන්නේ
හැඩකාරයි මනහාරයි පරිසරයම රස වෙන්නේ
ගින්දර මෙන් හිනැහුනාට එපා ගින්දරක් ගන්නේ

සුසුම් කුණාටුවක් එක්ක අරන්න යන්න එපා ඉතින්
පැතුම් පුරාගෙන ජීවිත පිබිදෙන්නට දෙන්න සිතින්
උතුම් ආදරේට සතුට ලං කරලා තියා රතින්
නැටුම් නියඟලා මල නුඹ අවිහිංසක වෙයන් බැතින්

# ඇත්ත දකිමු

**ජයසේන කොඩිතුවක්කු, වත්තල.**

සතා  කැලෙන් ගෙන ආවේ අපි  නොවෙද
ඇතා  කියා නම දුන්නෙත් අපි  නොවෙද
ඉතා  හොඳසතා ලෙස හිතුවෙත් අපි  නොවෙද
හිතා  මතා වැඩ නොකලෙත් අපි  නොවෙද

තිරිසන්  භවය හිමි කර ගත්  සතුන් හට
මනසින්  හැකි වේද කිසිවක්  දකින්නට
සුවඳින්  රූපයෙන් සංඥා  ගත්තාට
විඥානයෙන් බැහැ තේරුම් කර  ගන්ට

වනේ  සිටි සතා අල්ලා ගෙන  ඇවිදින්
කනේ පාර දී හීලෑ කරති  සොඳින්
අනේ  ඉතින් හයට ම උඟ අදියි  කොටන්
සෙනේ උගේ කුස ගිනි නිවෙනා  පමණින්

තමන් ගේ තරම අලියා දන්නෙ  නැති
අනුන් ගේ බහට භය වී යටත්  වෙති
පතන්නේ රැහේ සුවඳයි පෙර  පවැති
සතුන් ගේ සතුට මිනිසුන් සලකන්නෙ  නැති

සතා කැලේ සිටියා නම් හොඳ  නැද්ද
අපේ වැඩට ඇයි අපි තව හුරු  නැද්ද
කොහේ ඉන්න නයි අපි මේ  දාගෙනද
රටට වටින සම්පත් බිලි  දෙනවාද

